දුරකථන
தொலைபேசி
Telephones } 011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary } 011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax } 011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின்அஞ்சல்
E-mail } info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம் } www.psc.gov.lk

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல.1200/9, இராஜமல்வத்தை வீதிபத்தரமுல்லை ,
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය
எனது இல.
My No. } PSC/APL/11/AT/Reg.Gen.Dpt/2026

ඔබේ අංකය
உமது இல.
Your No. } HA/05/20/01/01/20

දිනය
திகதி
Date } 2026.05.26

**ලේකම්**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

**<u>රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**

**<u>රෙජිස්ට්‍රාර් සේවය II පන්තිය (ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්)/ රෙජිස්ට්‍රාර් සේවය III පන්තිය I හා II ශ්‍රේණිය, (අතිරේක දිස්ත්‍රික්/ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර්)/ ලේඛන සහකාර සේවය III/II</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වන ඔබගේ සමාංක හා 2026.01.16 දිනැති ලිපිය හා බැඳේ.

02) ඉහත සඳහන් සේවාවන්හි නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇති මෙම සියලු 2026 වාර්ෂික ස්ථාන මාරු තීරණ වහාම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි.

03) එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා යැවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2(ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වූවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බව ද වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙමි.

05) 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේ ද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙස ද ඔබ වෙත දන්වා සිටිමි.

06) වාර්ෂික ස්ථාන මාරු නියෝග නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257(V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

07) එසේම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

08) ඔබගේ සමාංක හා 2026.01.16 දිනැති ලිපිය මගින් 2026 ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ දිනය 2026.04.01 දින දක්වා දීර්ඝ කිරීමටත් ඊට පසු දිනක ක්‍රියාත්මක වීමට නියමිත ස්ථාන මාරු චක්‍ර එකී නියෝගයන්හි සඳහන් දින සිට ක්‍රියාත්මක කිරීමටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා ඇත. එම ඉල්ලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2026 වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සම්බන්ධ රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ

රෙජිස්ට්‍රාර් සේවය II පන්තිය (ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්)/ රෙජිස්ට්‍රාර් සේවය III පන්තිය I හා II ශ්‍රේණිය, (අතිරේක දිස්ත්‍රික්/ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර්)/ ලේඛන සහකාර සේවය III/II

| අනු අංකය | නම | තනතුර හා පන්තිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | එන්.එන්. යාපා මහත්මිය | ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් රෙජිස්ට්‍රාර් සේවය II පන්තිය | මාතර ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය | ගාල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය | අභියාචනය නිශ්ප්‍රභ කිරීම.<br>රෙජිස්ට්‍රාර් සේවයේ අදාල තනතුරට ඉදිරි නව බඳවා ගැනීම් සිදු කිරීමේදී අභියාචක විසින් ඉල්ලුම් කරනු ලබන සේවා ස්ථානයකට සාමාන්‍ය ස්ථාන මාරු යටතේ ස්ථාන මාරුවක් ලබා දීමට සලකා බලන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත දැන්වීම. |
| 2 | ආර්.පී.එල්. සුජීවා මහත්මිය | අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් රෙජිස්ට්‍රාර් සේවය III පන්තිය II ශ්‍රේණිය | හොරණ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය | බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිශ්ප්‍රභ කිරීම |
| 3 | එස්.බී. විතානාච්චි මහත්මිය | අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් රෙජිස්ට්‍රාර් සේවය III පන්තිය/ Iශ්‍රේණිය | කළුතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය | 2026 වාර්ෂික ස්ථාන මාරු ලැබී නැත | අභියාචනය නිශ්ප්‍රභ කිරීම.<br>හැකියාව පවතී නම් සාමාන්‍ය ස්ථාන මාරුවීම් යටතේ ස්ථාන මාරු ඉල්ලීම සලකා බලන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත දැන්වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | එම්.ඩබ්ලිව්.එල්. නිශාදනී මහත්මිය | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් රෙජිස්ට්‍රාර් සේවය III පන්තිය I ශ්‍රේණිය | ගෝනාපීනුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම.<br>හැකියාව පවතී නම් සාමාන්‍ය ස්ථාන මාරුවීම් යටතේ ස්ථාන මාරු ඉල්ලීම සලකා බලන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත දැන්වීම. |
| 5 | ජේ.ජී.ඒ.ටී. මානෙල් මහත්මිය | ලේඛන සහකාර II ශ්‍රේණිය | තංගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය | හම්බන්තොට ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය | අභියාචනයට ඉඩදීම.<br>ලබා දී ඇති 2026 වාර්ෂික ස්ථාන මාරුව අවලංගු කිරීම. |
| 6 | එච්.වයි.ඒ. ගුණවර්ධන මහත්මිය | ලේඛන සහකාර III ශ්‍රේණිය | හම්බන්තොට ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය | තංගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය | අභියාචනයට ඉඩදීම.<br>ලබා දී ඇති 2026 වාර්ෂික ස්ථාන මාරුව අවලංගු කිරීම |
| 7 | ටී.පී.එච්.එච්. ධර්මරත්න මහත්මිය | ලේඛන සහකාර III ශ්‍රේණිය | බස්නාහිර කලාප කාර්යාලය | බලපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට ලද 2026 වාර්ෂික ස්ථාන මාරුව අවලංගු කිරීම. | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම.<br>හැකියාව පවතී නම් සාමාන්‍ය ස්ථාන මාරුවීම් යටතේ ස්ථාන මාරු ඉල්ලීම සලකා බලන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත දැන්වීම. |